# ශ්‍රී ලංකාවේ තුරඟ තරඟ සඳහා පරදු තැබීම ආශ්‍රිත ආර්ථික සහ සමාජීය ප්‍රතිවිපාක


එම්.පී. අජිත් සිසිර කුමාර

FGS/E/MSSC/2003/06


කැලණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාපති (ආර්ථිකවිද්‍යාව) පශ්චාද් උපාධි පරීක්ෂණයෙහි අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධයකි.


| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 457 |
| වර්ග අංකය: | |

# සම්පිණ්ඩණය

ගෝත්‍රික සමාජවල සිටම මිනිසාම පරදු තැබීමට යොමුව සිටි බව හඳුනාගත හැකි වේ. සමාජය දියුණුවත්ම පරදු තැබීමද දියුණුවට පත්වූ බව පෙනේ. ඉංග්‍රීසි යටත් විජිත සමයේ ශ්‍රී ලංකාවේ තුරඟ තරඟ ආරම්භ වී ඇති අතර ඒ සඳහා පරදු තැබීම සිදුකර ඇත. පසුව තුරඟ තරඟ මෙරට පැවැත්වීම සීමා වූ විට එංගලන්තය සහ අනිකුත් යුරෝපීය රටවල පැවත්වෙන තුරඟ තරඟ සඳහා පරදු තැබීමට මෙරට පරදු තබන අයවලුන් යොමුව ඇත.

වර්තමානය වනවිට පරදු තැබීම විශාල වශයෙන් ව්‍යාප්තවී ඇති අතර ඒ සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ඒ සඳහා දිනපතා යෙදවීම දක්නට ලැබේ. මෙම තත්ත්වයන් මත වර්තමානය වන විට තුරඟ තරඟ සඳහා පරදු තැබීම ආර්ථික හා සමාජමය වශයෙන් ඇතිකරන බලපෑම කුමක්ද? යන්න මෙහි අධ්‍යයන ගැටළුව වේ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණවන්නේ තුරඟ තරඟ සඳහා ඔට්ටු ඇල්ලීම ආර්ථික හා සමාජමය වශයෙන් ඇතිකරන බලපෑම කුමක්ද යන්න හඳුනාගැනීමත් ඒ සඳහා නිගමන යෝජනා කිරීමත්ය. ක්ෂේත්‍ර සමීක්ෂණ මඟින් ප්‍රාථමික දත්ත ලබාගන්නා අතර පොත් සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තු වාර්තා මඟින් ද්විතියික වාර්තා ලබා ගෙන අධ්‍යයනය සිදු කර ඇත. අධ්‍යයනය මඟින් පැමිණි නිගමනය නම් රජය මෙය සම්පූර්ණයෙන්ම තහනම් කිරීම සිදුකළ යුතුය. එසේ තහනම් කළ නොහැකි නම් ඒ සඳහා දැඩි නීති රීති පනවා දැඩිව ක්‍රියාත්මක කිරීම මඟින් දැඩි ලෙස සීමාකිරීම මඟින් මෙම අහිතකර තත්ත්වය අවම කරගත හැකි වේ.